සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

**10 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- අංක 01 සිට 20 තෙක් වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01. අන්තර් වර්තී පුද්ගල සන්නිවේදනය පිළිබඳ නිමේෂා දක්වූ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - තමා සමග කරනු ලබන සන්නිවේදනයකි.

B - ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණ මත සිදු වේ.

C - පුද්ගල මනස මුල් කරගනිමින් සිදු වේ.

(1) AB සත්‍ය වේ. C අසත්‍ය වේ. (2) AC සත්‍ය වේ. B අසත්‍ය වේ.
(3) BC සත්‍ය වේ. A අසත්‍ය වේ. (4) ABC යන සියල්ලම සත්‍ය වේ.

02. පන්ති කාමරයක දී පහසුවෙන් භාවිත කළ හැකි පහසු දෘශ්‍ය මාධ්‍ය උපකරණය වන්නේ,

(1) ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රය. (2) පිටු පෙරලනය
(3) කළු ලෑල්ල (4) විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය

03. සමූහ සන්නිවේදනය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) බොහෝ විට නායකයෙක් සිටී.
(2) සමූහය සම්මුඛ වේ.
(3) සන්නිවේදන කාර්යය සජීවී වේ.
(4) තාක්ෂණික උපකරණ භාවිතය අනිවාර්යය වේ.

04. එසැනින් තොරතුරක් ලබාදිය නොහැකි මාධ්‍යය වන්නේ මින් කුමක් ද?

(1) පුවත්පත (2) ගුවන් විදුලිය (3) දුරකථනය (4) රූපවාහිනිය

05. පුද්ගලයෙකු තුළ සිදුවන ආත්ම භාෂණය නම්,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනයයි. (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය යි.
(3) ජන සන්නිවේදනය යි. (4) සමූහ සන්නිවේදනය යි.

06. වේදිකා නාට්‍යයක දී වඩාත් දැකගත හැක්කේ,

(1) විධිමත්. වාචික, ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය යි.
(2) වාචික, අවාචික, ශ්‍රව්‍ය හා දෘශ්‍ය සන්නිවේදනය යි.
(3) ශ්‍රව්‍ය, වාචික, අවිධිමත් හා ලිඛිත සන්නිවේදනය යි.
(4) වාචික, අවාචික, අවිධිමත් හා ලිඛිත සන්නිවේදනය යි.

07. විද්‍යුත් සන්නිවේදන ක්‍රියාවලියක දී බාධකයක් නොවන්නේ,

(1) ගුවන් යානයක් ඉහළින් පියාසර කිරීමයි. (2) මාධ්‍යමය දැනුම නොමැති වීමයි.
(3) ග්‍රාහකයාගේ අසනීප තත්වයයි. (4) ආවරණ කලාපය තුළ සිටීමයි.

08. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ විග්‍රහයට අනුව ජනමාධ්‍යයේ කාර්යයක් නොවන්නේ,

(1) පරිසරය ආරක්ෂා කිරීමට රුකුල් දීම
(2) ආරක්ෂකයෙකුගේ කාර්යය ගැනීම
(3) පරිසරයට බලපාන සාමාජිකාංග සම්බන්ධ කිරීම.
(4) සමාජ උරුමය අඛණ්ඩව ව්‍යාප්ත කිරීම.

09. විකේතිකරය යනු පණිවිඩය,

(1) සම්ප්‍රේෂණය කරන්නා ය. (2) පෝෂණය කරන්නා ය.
(3) ප්‍රතික්ෂේප කරන්නා ය. (4) ප්‍රතිග්‍රහණය කරන්නා ය.

10. 1909 වර්ෂයේ ආරම්භ කරන ලද දිනමිණ පුවත්පතේ මුල් හිමිකාරිත්වය දැරුයේ,

(1) D. R. විජේවර්ධන මහතා (2) H. S. පෙරේරා මහතා

(3) D. B. ධනපාල මහතා (4) රංජිත් විජේවර්ධන මහතා

11. පාසල් අධ්‍යාපන චාරිකාවක දී සිසුන් සියල්ලම සිටින ඡායාරූපයක් ගැනීමට නම් වඩාත් යෝග්‍ය කාච වර්ගය වන්නේ,

(1) සාමාන්‍ය කාචයයි. (2) දුර රූප කාචයයි

(3) පුළුල් කෝණ කාචයයි (4) වීඩියෝ කාචයයි

12. නිර්වාචික සන්නිවේදනය ඉතා ප්‍රබල හා කලාත්මක ලෙස භාවිතා කළ හැකි මාධ්‍යයක් ලෙස හැඳින්වෙන්නේ,

(1) සිනමාවයි. (2) රූපවාහිනියයි (3) පුවත්පතයි (4) අන්තර්ජාලයයි.

13. සිනමාවේදී හා රූපවාහිනියේදී සංස්කරණය මගින්, නිර්මාණයේ,

(1) රිද්මය රඳවාගත හැකිය (2) අර්ථෝද්දීපනය කළ හැකිය.

(3) දිග අඩු කරගත හැකිය. (4) දුර්වල කොටස් කපා ඉවත් කරගත හැකිය.

14. එක්තරා මංගල ඡායාරූපයක මනාලියගේ දෑස් බාගෙට පියවී තිබුණේය. මේ දෝෂය වළක්වා ගත හැකි වනුයේ,

(1) ප්‍රභල ආලෝකයක් සහිත විදුලි පහනක් භාවිතා නොකිරීමෙනි.

(2) ඡායාරූපය ගන්නා විට කැමරාව නොසෙල් වී තබා ගැනීමෙනි.

(3) නිවැරදි මොහොතේ ඡායාරූපය ගැනීමෙනි.

(4) වැඩි ද්වාර වේගයක් භාවිතා කර ඡායාරූපය ගැනීමෙනි.

15. වර්ණ ඡායාරූපකරණයේ දී ඡායාරූපය නිර්මාණය වන වර්ණ වන්නේ,

(1) රතු, කොළ සහ නිල් වේ. (2) රතු, නිල් සහ කහ වේ.

(3) සයන්, මැජෙන්ටා සහ කළු වේ. (4) දේදුන්නේ වර්ණාවලිය වේ.

16. පුවත්පතක සාහිත්‍ය පිටුව සැකසීමට සෘජු ලෙසම දායක නොවන්නේ,

(1) විශේෂාංග කතෘ ය. (2) චිත්‍ර ශිල්පියා ය.

(3) ප්‍රවෘත්ති කර්තෘ ය. (4) සෝදුපත් කියවන්නා ය.

17. රූපවාහිනී නාට්‍යවලට අනුව ස්ත්‍රියට හා පුරුෂයාට පැවරෙන නිශ්චිත රැකියා, වගකීම් හා හැසිරීම් රටා සමුදායක තිබෙන බව දක්වේ. මෙම තත්වය සාකච්ඡා කෙරෙන සංකල්පය වන්නේ,

(1) ස්ත්‍රී වාදයයි. (2) ස්ත්‍රී පුරුෂ සමාජ භාවයයි.

(3) ස්ත්‍රී පුරුෂ චර්යා රටාවයි. (4) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයි.

18. සාර්ථක ඡායාරූපයක ලක්ෂණයක් නොවන්නේ,

(1) නිසි මොහොත සටහන් වී තිබීමයි.

(2) නිවැරදි රාමුව ඇතුළත් වී තිබීම යි.

(3) අධික හෝ මන්ද අනාවරණය වී තිබීමයි.

(4) ක්ෂේත්‍ර ගැඹුර පාලනය වී තිබීම යි.

19. පාසලේ සීනුවෙන් කරනු ලබන සන්නිවේදනය අයත් වන්නේ,

(1) ශ්‍රව්‍ය මෙන්ම අවාචික සන්නිවේදනයට ය.

(2) අවාචික මෙන්ම සාම්ප්‍රදායික සන්නිවේදනයට ය.

(3) සාම්ප්‍රදායික මෙන්ම දෘෂ්‍ය සන්නිවේදනයට ය.

(4) ශ්‍රව්‍ය මෙන්ම පුද්ගලාන්තර සන්නිවේදනයට ය.

20. උදෑසන අවදි වූ සුගත් ට දනුන හිසරදය නිසා ඔහු කාර්යාලයට නොයෑමට තීරණය කළේය. මෙබඳු අවස්ථාවක දක්නට ලැබෙන්නේ,

(1) අවිධිමත් සන්නිවේදනය යි. (2) අන්තර් වර්තී සන්නිවේදනය යි.

(3) අන්තර් පුද්ගල සන්නිවේදනය යි. (4) නිර්වාචික සන්නිවේදනය යි.

21. සන්නිවේදන ක්‍රියාවලියේ මූලික අංග කිහිපයක් ලෙස සැලකිය හැකි වන්නේ,
   (1) ඝෝෂා, සන්දර්භය, විකාශනය හා ප්‍රතිපෝෂණයයි.
   (2) සන්නිවේදකයා, දොරටුපාලකයා, විචාරකයා හා ග්‍රාහකයා යි.
   (3) බලපෑම, ග්‍රාහකයා, පනිවිඩය සහ නිවේදකයා යි.
   (4) ග්‍රාහකයා, පණිවිඩය, බලපෑම සහ මාධ්‍යය යි.
22. කෙටිදුර රූපවාහිනී ජාල යොදා ගන්නේ ප්‍රධාන වශයෙන්,
   (1) ප්‍රවෘත්ති හා නිවේදන බෙදා හැරීම සඳහාය.
   (2) ආරක්ෂක හා පිරික්සුම් කටයුතු සඳහා ය.
   (3) අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ය.
   (4) පෙළඹවීම් හා විනෝදාස්වාද සම්පාදනය සඳහා ය.
23. ඉතාම නිවැරදිව කැමරා තාක්ෂණය භාවිතා කළ ද, එක්තරා සේයා පටලයකින් ගත් ඡායාරූප වල මතු පිට ලප ආදිය මතු වී විනාශ වී තිබුණි. එයට ආසන්නතම හේතුව වී ඇත්තේ, එම සේයා පටලය,
   (1) කල් ඉකුත් වූ එකක් වීමය.
   (2) ආලෝකයට අනාවරණය වී තිබීමය.
   (3) නිෂ්පාදනය දෝෂ සහගත බවයි.
   (4) බාල වර්ගයේ එකක් වීමයි.
24. මාධ්‍ය වේදියෙකුගේ ප්‍රධාන යුතුකම වන්නේ,
   (1) මාධ්‍ය ආයතනයේ හිමිකරුට අවනත වීමයි.
   (2) රජයේ නියමයන් නිසි පරිදි පිළිපැදීමයි.
   (3) පොදු මහජන යහපත වෙනුවෙන් පෙනී සිටීමයි.
   (4) තම අංශ ප්‍රධානියාගේ උපදෙස් නිසි ලෙස පිළිපැදීමයි.
25. ෆැක්ස් යන්ත්‍රය මගින්,
   (1) එක් තැනක සිට තවත් තැනකට පණිවිඩයක් යැවිය හැකිය.
   (2) ලිපියක් තවත් ෆැක්ස් යන්ත්‍රයකට යැවිය හැකිය.
   (3) කඩදාසියක ඇති ඕනෑම සටහනක් තවත් ෆැක්ස් යන්ත්‍රයකට යැවිය හැකිය.
   (4) එක් තැනකින් තවත් තැනකට කෙටි පණිවිඩයක් යැවිය හැකිය.
26. පුවත්පත් ආයතනික ව්‍යුහයක ප්‍රධාන අංශ වන්නේ,
   (1) පාලන අංශය, දැන්වීම් අංශය, කර්තෘ මණ්ඩලය, මුද්‍රණ හා බෙදාහැරීමේ අංශය යි.
   (2) කර්තෘ මණ්ඩලය, ලේඛක මණ්ඩලය, මුද්‍රණ අංශය හා බෙදාහැරීම් අංශයයි.
   (3) අධ්‍යක්ෂ මණ්ඩලය, කර්තෘ මණ්ඩලය, දැන්වීම් අංශය හා අලෙවි ප්‍රවර්ධන අංශයයි.
   (4) දැන්වීම් අංශය, පිටු සැකසුම් අංශය, සෝදුපත් අංශය හා මුද්‍රණ අංශය යි.
27. විද්‍යුත් නාලිකාවක් සඳහා රජය විසින් ලබා දී ඇති බලපත්‍රය
   (1) මාධ්‍ය ආයතනය සතු අයිතියකි.
   (2) රජයේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.
   (3) කොන්දේසි කඩ කළ විට අවලංගු කළ හැකිය
   (4) වලංගු වන්නේ වසර 05 කට පමණි.
28. නිදසුන් තැපැල පිළිබඳව මතු වූ අදහස් කිහිපයක් මෙසේ ය.

   A - කෙටි කාලයක් තුළ ලෝකයේ ඕනෑම තැනකට යැවිය හැකි වීම.
   B - යවන හා ලැබෙන ලිපිවල පිටපත් තැන්පත් කර ගත හැකි වීම.
   C - ලිපියට අතිරේකව ඡායාරූප හා දීර්ඝ ලේඛන යැවිය හැකි වීම
   D - එකම ලිපිය ලිපිනගණනාවකට එකවර යැවිය හැකි වීම.

   (1) A, B, හා C පමණක් නිවැරදි ය.
   (2) A, C හා D පමණක් නිවැරදිය
   (3) B, C හා D පමණක් නිවැරදි ය.
   (4) A, B, C හා D සියල්ලම නිවැරදිය.
29. ග්‍රහණතාව (resolution) ලෙස හැඳින්වන්නේ,
   (1) ග්‍රහණය කරගත හැකි තොරතුරු ප්‍රමාණය යි.
   (2) වර්ග අඟලක් තුළ පවතින පික්සල් සංඛ්‍යාවයි.
   (3) වර්ග සෙන්ටිමීටරයක් තුළ පවතින කුඩා අංශු ප්‍රමාණය යි.
   (4) රූපය ග්‍රහණය කර ගැනීමට අවශ්‍ය ධාරිතාවයි.
30. කාර්යාලයීය මාධ්‍ය උපකරණ අතර යල්පැන යමින් ඇත්තේ,
   (1) ස්කෑන් යන්ත්‍රයයි.
   (2) විද්‍යුත් යතුරු ලියනයයි
   (3) ඡායා පිටපත් යන්ත්‍රයයි
   (4) දුරකථනයයි.

31. වර්ණ විනිවිදක ප්‍රක්ෂේපණ යන්ත්‍රය වඩාත් උචිත වන්නේ තම ඉදිරිපත් කිරීම තුළ,
   (1) සංඛ්‍යා සහ රූපාශ්‍රිත දත්ත වැඩිපුර ඇති වීමය.
   (2) පෙළ, රූප සහ සංඛ්‍යා ආශ්‍රිත දත්ත වැඩිපුර ඇති වීමය.
   (3) රූප හා සිතියම් ආශ්‍රිත දත්ත වැඩිපුර ඇති වීමය.
   (4) චලන රූප හා රූපසටහන් වැඩිපුර ඇති වීමය.

32. සමාජ පන්ති ගොඩනැගීමේ ප්‍රධාන සාධකය වන්නේ,
   (1) ආර්ථිකයයි (2) අධ්‍යාපනයයි (3) දේශපාලනයයි (4) වෙනත් කුසලතායි

33. 

I



II



මෙහි දක්වා ඇති I හි සඳහන් දෝෂය මඟහරවාගෙන II ඡායාරූපය ලබාගෙන ඇත. ඒ සඳහා සිදුකළ යුත්තේ,
   (1) අධිවේගී සේයා පටලයක් භාවිතා කර ඡායාරූප ගැනීමයි.
   (2) ඡායාරූප ශිල්පියා හිරු එළියට පිටුපා ඡායාරූපය ගත යුතුය.
   (3) දහවල් වෙනුවට උදෑසන හෝ සවස ඡායාරූප ගත යුතුය.
   (4) විද්‍යුත් ක්ෂණිකාලෝකයක් භාවිතා කර ඡායාරූපය ගත යුතුය.

34. ඔබ වෙත ලැබෙන දුරකථන ඇමතුමක් කවර දුරකථන අංකය සහිත දුරකථනයක් භාවිතා කර ලබා ගත්තේ ද යන්න දැන ගැනීමට ඔබගේ දුරකථනයේ තිබිය යුතු පහසුකම වන්නේ,
   (1) IDD ය (2) CLI ය (3) CDM ය (4) GPRS ය

35. අක්ෂි සම්බන්ධතාව පවත්වන ප්‍රදීපාගාරය උපක්‍රමයේ දී ඊට සම්බන්ධ පාර්ශව දෙක වන්නේ,
   (1) ග්‍රාහකයා හා සෙසු ග්‍රාහකයින් ය. (2) ග්‍රාහකයා හා කර්මකයාය.
   (3) කථිකයා හා ග්‍රාහකයාය. (4) කථිකයා හා සෙසු කථිකයින් ය.

36. ආකේතන ක්‍රියාවලියේ දී සන්නිවේදකයා වඩාත් අවධානයට යොමු කළ යුත්තේ,
   (1) ආකර්ශණීය සංකේත භාවිතා කිරීමට ය.
   (2) නිර්මාණාත්මක සංකේත භාවිතා කිරීමට ය.
   (3) සන්නිවේදක කේන්ද්‍රීය සංකේත භවිතා කිරීමටය.
   (4) සම්මත සංකේත භාවිතා කිරීමටය

37. පුවත්පතක ලුහුඬු දැන්වීමක් පළකරන්නේ නම්, ඒ සඳහා ගාස්තු අය කරන නිර්ණායකය වන්නේ,
   (1) දැන්වීම පළ කරන පිටුව හා ස්ථානය යි.
   (2) දැන්වීමේ අඩංගුවන වචන ප්‍රමාණය යි.
   (3) දැන්වීමට වර්ණ යෙදීම හෝ නොයෙදීම යි.
   (4) දැන්වීමට වැය වන ඉඩ ප්‍රමාණය යි.

38. ඡායාරූපකරණයේ දී මානනය යන්නෙන් අදහස් වන්නේ,
   (1) අරමුණ ඉලක්ක කොට තෝරාගත් පිහිටුමක කැමරාව රැඳවීම යි.
   (2) අරමුණ වඩාත් තීක්ෂණ ලෙස ග්‍රහණය කර ගත හැකි පිරිදි කාචය සකස් කිරීමයි.
   (3) පටලයට ආලෝකය ලබාදීමට ද්වාරායේ පිහිටීම සකස් කිරීමයි.
   (4) රූපගත කිරීමට පෙර කැමරාව නිශ්චිත ලෙස ස්ථානගත කිරීමයි.

39. ඡායාරූපයක "පැහැඅන්තරය" ලෙස අදහස් වන්නේ,
   (1) උණුසුම් වර්ණ හා සිසිල් වර්ණ එකිනෙක මිශ්‍ර කිරීමයි.
   (2) ඡායාරූපයක පැහැය උපරිම මට්ටමට සකස් කිරීමයි.
   (3) ඡායාරූපයක ආලෝකය හා අඳුර අතර අනුපාතය යි.
   (4) ඡායාරූපයක වර්ණ අතර අනුපාතය යි.

40. ලිඛිත සන්නිවේදනය සඳහා මානවයා පෙළඹුනේ,
   (1) විනෝදාස්වාදය ලැබිය හැකි නිසාය.
   (2) අකුරු කියවීමට හැකි වූ නිසාය.
   (3) වාචික සන්නිවේදනයේ සීමා නිසාය.
   (4) කඩදාසිය සොයාගත් නිසාය.

සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved*

## අවසාන වාර පරීක්ෂණය 2015

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**10 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න. (ප්‍රශ්න 05 යි)**

01. පාසලේදී සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය හැදෑරූ සපුමල් සා/පෙළ විභාගයෙන් පසු ඡායාරූපකරණය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීමට අදහස් කරයි.

(1) මේ සම්බන්ධයෙන් ඔහු සිය දෙමාපියන් සමඟ සාකච්ඡා කළේය. මෙහිදී දැකිය හැකි සන්නිවේදන වර්ග 02 ක් හා ඊට අදාළ අනුරූප අවස්ථා නම් කරන්න.

(2) ඉහත I ට අනුව හඳුනාගත හැකි සන්නිවේදන ස්වරූප 02 ක් හා ඊට අනුරූප අවස්ථා නම් කරන්න.

(3) නිශ්චල ඡායාරූපයක් යනු කුමක්ද?

(4) නිශ්චල ඡායාරූපකරණය සඳහා යොදාගත හැකි කැමරා වර්ග 02 ක් නම් කරන්න.

(5) සපුමල් විසින් තමන් තොරාගත් කිහිප දෙනෙකුට පමණක් මෙම පාඨමාලාව පිළිබඳව දැනුම් දුන්නේ ය. ඔහුගේ මෙම ක්‍රියාව අවිධිමත් සන්නිවේදනයේ කුමන ස්වරූපයකට (දාමයකට) අයත් වේද?

(6) ඡායාරූපකරණ පාඨමාලාව හැදෑරීමෙන් ඔහු ලබන සහතික පත්‍රය වඩා ආරක්ෂාකාරී ලෙස තබා ගැනීමට නම්, සපුමල් ඒ සඳහා කුමක් කළ යුතු ද?

(7) අනාවරණය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද?

(8) පරිගණකයක් මගින් සංස්කරණය කළ හැකි ඡායාරූප ක්‍රමවේදය වන්නේ කුමක් ද?

(9) ඔබගේ ඡායාරූපයක් ඉතා ඉක්මනින් විදේශගතව සිටින ඔබගේ මාමාට යැවිය යුතුව ඇත. ඔබ මේ සඳහා කුමක් කරන්නේ ද?

(10) පුවත්පත් මාධ්‍ය තුළ ඡායාරූප භාවිතා වන අවස්ථා කීයද? ඒ මොනවා ද? $(2 \times 10 = 20)$

02. (1) සන්නිවේදනයේ අරමුණු 04 ක් ලියන්න. (ල.02)

(2) ''මට හෙට අධ්‍යාපන චාරිකාව යන්න, එන්න ලැබෙන්නේ නැහැ.'' ළහිරු පහන්ට කීවේ ය. ඉහත සන්නිවේදන ක්‍රියාවලියේ දක්නට ලැබෙන මූලික අංග 03 ක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.04)

(3) ඉහත සන්නිවේදන ක්‍රියාවලියේ සිදු වූ සන්නිවේදන වර්ගය නම් කර එහි දක්නට ලැබෙන විශේෂතා 04 ක් ලියන්න. (ල.05)

03. (1) සදාචාරය හා සාරධර්ම යන්න පැහැදිලි කරන්න. (ල.02)

(2) (අ) ගැටුමක් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද? (ල.02)

(ආ) ගැටුමක් නිරාකරණය කිරීමට සුදුසු පාර්ශවයන් 02ක් ලියන්න. (ල.02)

(3) සන්නිවේදනය හා පවුල් සංස්ථාව අතර ඇති සබඳතාවය පැහැදිලි කරන්න. (ල.04)

04. එක්තරා නගරයක ජනතාව විසින් භාණ්ඩ හා සේවා වල පොදු මිල ගණන් අඩු කරන ලෙස ඉල්ලමින් නගරයේ පාගමනක් සංවිධානය කර තිබුණි.

(1) ඉහත සිදුවීම පුවත්පතට වාර්තා කිරීම සහ ඡායාරූප ගැනීම ඔබට පැවරී ඇත. ඒ සඳහා අවශ්‍යය කරන කැමරා උපාංග 03 ක් නම් කරන්න. (ල.03)

(2) ඔබට වෙළඳපළෙන් මිලදී ගත හැකි පටල පටි වර්ග 03 ක් සඳහන් කරන්න. (ල.03)

(3) රූප සංරචනය ලෙස අදහස් වන්නේ කුමක් ද? (ල.04)

05. (1) විදුලි බලය නොමැතිව භාවිතා කළ හැකි පන්ති කාමර මාධ්‍ය උපකරණ 02 ක් නම් කරන්න. (ල.02)

(2) පන්ති කාමරයක බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ උපකරණ භාවිතයේ ඇති වැදගත්කම කරුණු 02 ක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ල.02)

(3) පරිගණක ආශ්‍රිත ප්‍රකාශනයේ වාසි 04 ක් කෙටියෙන් විස්තර කරන්න. (ල.06)

06. ඔබ ප්‍රදේශයේ අබලන් වී ඇති මහාමාර්ග පිළිබඳ ප්‍රවෘත්තියක් රූපවාහිනී ආයතනයක ප්‍රචාරය කිරීමට සම්පාදනය කරන්න. (ල.10)